# පාන් වලට මොකද වුනේ ?



අනුත්මි ලිහන්සා කුලතුංග

කෘතියේ නම :- පාන් වලට මෙකද වුනේ?

කතෘ :-අනුත්මී ලිහන්සා කුලතුංග

මහාමායා බාලිකා විදුහල/මහනුවර

2- C

කෘතියේ අයිතිය කතෘ සතුය.

ISBN 978 624 208 312 4

## පිදුම

*මහාමායා විදුමැණියන්ට*

*උපහාර පිණිස*

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතිත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

## *පාන් වලට මොකද වුනේ ?*

අපේ ගෙදර බලු සුරතලෙක් හිටියේ නෑ. ඒ උනාට අපි හැමෝටම හිටිය සුරතලා තමයි අපේ නැන්දාගේ ගෙදර හිටිය රෙක්සි බලු පැටියා.



මේ බලු පැටියා හැමදාම අපේ ගෙදර එනවා. එයා හරිම සුරතල් බලු පැටියෙක්.

මමයි, අයියයි, නංගියි රෙක්සි එක්ක බෝල සෙල්ලම් කරන්න හරිම ආසයි. රෙක්සි බෝල අල්ලන්න හොඳ හපනෙක්.



මේ රෙක්සි අපේ ගෙදරින් කෑම කන්න හරි කැමතියි.ඉතින් මේ රෙක්සිට හරි අපූරු පුරුද්දක් තිබුණා. එයාට අපේ ගෙදරින් යන්නනම් රෙක්සිට පාන් පෙත්තක් ඕනේමයි.

එයා පාන් පෙත්තක් දෙනකම් නගුට වන වනා පාන් පෙට්ටිය දිහා බලාගෙන ඉන්නවා. පාන් දෙනකම්ම කෙඳිරි ගානවා. මේක එයාගේ හරි අපූරු පුරුද්දක් වුණා. පාන් දෙනකම්ම රෙක්සි යන්නේ නෑ. ඒ නිසා අපේ අම්මා රෙක්සිට දෙන්න ගෙදර පාන් තියාගෙන ඉන්නවා.



හැබැයි මේ රෙක්සි පාන් අරන් ගියාට ඒ වෙලාවේ නම් කන්නේ නෑ.

රෙක්සි පාන් අරන් ගිහින් නැන්දලාගේ මිදුලේ වලවල් තුනක් විතර හාරලා එක වලක් ඇතුලට පාන් පෙත්ත දාලා වල වහනවා. ඊට පස්සේ පසුවදා උදේට වලෙන් එළියට පාන් අරන් පස් ගසලා එයා පාන් කනවා.



මේක එයාගේ පුරුද්දක් වුණා.

එක දවසක් උදේ රෙක්සි කෙඳිරි ගගා මිදුල පුරා වලවල් හාරනවා මම දැක්කා. මම නැන්දාගෙන් ඇහැව්වා ඒ ඇයි කියලා. නැන්දා කිව්වේ රෙක්සි වලදාපු පාන්පෙත්ත හොයාගන්න බැරුව තමයි රෙක්සි එහෙම හැසිරෙන්නේ කියලා.

එදා ඉඳලා එක දිගටම දවස් තුනක්ම වල දාන පාන් පෙත්ත නැතිව උදේට රෙක්සි අඬනවා.

අයියටයි මටයි දුකයි රෙක්සි අඬන නිසා, අපිදෙන්නා පාන් වලට මොකද වෙන්නේ කියලා හොයන්න කථා වුණා.


අපි දෙන්නා එක දවසක් උදේම නැගිටලා අම්මාට කියලා නැන්දලාගේ ගෙදර ගියා. නැන්දලාගේ ගෙදර අපේ ගෙදරට අල්ලපු වැටේ තියෙන නිසා අපි නිතර එහෙ යනවා. ඒ නිසා අම්මා බය නැතිව නැන්දලාගේ ගෙදර යන්න දෙනවා.

අපි දෙන්නා එදා උදේම නැන්දලාගේ ගෙදර සාලයේ මිදුල පැත්තට වෙන්න ඇති ජනේලය ළඟ පුටුවක වාඩිවෙලා මිදුල දිහා බලාගෙන හිටියා.

එදා අපිට පාන් වලට වෙන දේ හොයාගන්න පුළුවන් වුණා.



උඩහා ගෙදර බූලි බලු අම්මා උදේම ඇවිත් නැන්දලාගේ මිදුල ඉව කරනවා අපි දෙන්නා දැක්කා. ඒ වෙලාවේ රෙක්සි මේසය යට ඇති එයාගේ මෙට්ටය උඩ බඩත් උඩදාගෙන හොඳටම නිදි.



බූලි ඉව කරලා ඉව කරලා රෙක්සි හංගපු පාන් පෙත්ත හොයා ගත්තා.බූලි පාන් පෙත්ත වලෙන් එළියට අරන් ඒකෙ පස් හොඳට ගසලා පාන් පෙත්ත බූලිගේ ගෙදර අරන් යනවා අපි දෙන්නා නැන්දලාගේ ජනේලයෙන් බලාගෙන හිටියා.අපි දෙන්නා බූලි පස්සේ ගියා මෙයා පාන් වලට කරන දේ බලන්න.



අනේ බූලි අම්මගේ පැටව් දෙන්නට දෙන්න තමයි මෙයා පාන් අරන් යන්නේ. බලු පැටව් හරිම ආසාවෙන් ඒ පාන් කනවා.අපි දෙන්නට ඒක දැකලා ගොඩක් දුක හිතුනා.



එදා ඉඳලා අපි රෙක්සිට පාන් දුන්නට පස්සේ බූලිටයි එයාගේ පැටව් දෙන්නටයි පාන් පෙති තුනක්ම ගිහින් දෙනවා.

දැන්නම් රෙක්සිගේ පාන් නැතිවෙන්නේ නෑ.

නිමි.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්